# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 249/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 11/02/2024 පැය 1050

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.02.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 08 | 07 | 199 | 2374 | ගෑස් ලිප් 01<br>ගෑස් සිලින්ඩර් 01<br>තඹ දඟර 04<br>යකඩ බැරල් 10 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. නීති විරෝධීව වැලි ප්‍රවාහනය කල සැකකරුවෙකු ටිපර් රථයක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2024.02.10 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පේදුරුතුඩුව පොලිස් වසමේ කොවිඩිකඩවෙයි ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි ප්‍රවාහනය කල සැකකරුවෙකු ටිපර් රථය සමඟ අත්අඩංගුවට ගෙන පේදුරුතුඩුව පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වූ විශ්වමඩු ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පේදුරුතුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුර.**

2024.02.10 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අයියන්කුලම් පොලිස් වසමේ පලෙයිමුරුකණ්ඩි ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අයියන්කුලම් පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වූ තිරුමුරුකණ්ඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** අයියන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2024.02.10 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැලිකන්ද පොලිස් වසමේ මොණරතැන්න ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර විදේශීය රටක නිෂ්පාදිත බෝර 12 පතොරම් ගිනි අවියක්, පතොරම් 04ක් හා ඊයම් මුනිස්සන් 30ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැලිකන්ද පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වූ වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව වැලි පටවමින් සිටි සැකකරුවෙකු ටිපර් රථයක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර.**

2024.02.10 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරලංවිල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැලිකන්ද පොලිස් වසමේ බෝඅත්ත මාදුරුඔය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ටිපර් රථයකට වැලි පටවමින් සිටි සැකකරුවෙකු ටිපර් රථය සමඟ අත්අඩංගුවට ගෙන වැලිකන්ද පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**